# උඩපළාත ප්‍රාදේශීය සභාව
# 2022.08.16 දින ටෙන්ඩර් මණ්ඩල වාර්තාව

- **තීරණ අංක 01**

ගබඩාවට අවශ්‍ය මුද්‍රිත ලේඛන මුද්‍රණය කරවා ගැනීම සඳහා මිල ගණන් කැඳවීය. ඒ සඳහා ලද මිල ගණන් පහත පරිදි වේ.

| අනු අං: | විස්තරය | තිළිණ ප්‍රින්ටර්ස් | හිරු ප්‍රින්ටර්ස් | කේ. සී. ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|
| 01 | වැටුප් ලේඛන | 3500.00 | 4000.00 | 3750.00 |
| 02 | ඇණවුම් ලේඛන | 850.00 | 4600.00 | 4500.00 |
| 03 | බලපත්‍ර සහතික පොත් | 660.00 | 750.00 | 700.00 |
| 04 | බදු කුලී ආදායම් ලේඛන | 4000.00 | 4300.00 | 4200.00 |
| 05 | කේ පෝරම පොත් | 550.00 | 750.00 | 600.00 |
| 06 | වැය ලේඛන | 3500.00 | 4000.00 | 3700.00 |
| 07 | ගෙවීම් මුදල් පොත් | 3600.00 | 4000.00 | 3700.00 |
| 08 | තැන්පත් ලේඛන | 3600.00 | 4150.00 | 3800.00 |
| 09 | මිණුම් පොත්(ඇමු.01) | 1500.00 | 1800.00 | 1600.00 |
| 10 | ගෙවීම් වාර්තා(ඇමු.02) | 1500.00 | 1800.00 | 1600.00 |
| 11 | ගෙවීම් වාර්තා(ඇමු.04) | 1500.00 | 1750.00 | 1700.00 |
| 12 | ප්‍රා.ස.01 ලදුපොත් | 544.00 | 600.00 | 580.00 |

මේ සඳහා ලද මිල ගණන් අනුව අවම මිල යටතේ ද, මුද්‍රණ කටයුතු සම්බන්ධ මනා පලපුරුද්දක් ඇති බැවින්ද තිළිණ ප්‍රින්ටර්ස් ආයතනයෙන් වැටුප් ලේඛන 01ක් රු.3500.00 ට ත්, ඇණවුම් ලේඛන 01ක් රු.850.00 ට ත්, බලපත්‍ර සහතික පොත් 01ක් රු. 660.00 ටත්, බදු කුලී ආදායම් ලේඛන 01ක් රු. 4000.00 ටත්, කේ පෝරම පොත් 01ක් රු. 550.00 ටත්, වැය ලේඛන 01ක් රු. 3500.00 ට ත්, ගෙවීම් මුදල් පොත් 01ක් රු. 3600.00 ටත්, තැන්පත් ලේඛන 01ක් රු. 3600.00 ට ත්, මිණුම් පොත්(ඇමු.01) 01ක් රු.1500.00 ට ත්, ගෙවීම් වාර්තා(ඇමු.02) 01ක් රු.1500.00 ට ත්, ගෙවීම් වාර්තා(ඇමු.04) 01ක් රු. 1500.00 ටත්, ප්‍රා.ස.01 ලදුපොත් 01ක් රු. 544.00 ට ත් මුද්‍රණය කරවා ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 02**

සභාවට අයත් LL 7364 දරණ ජල බවුසරය සඳහා බැටරියක් මිලදී ගැනීමට ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි මෙන්ම ප්‍රාදේශීය සැපයුම්කරුවන්ගෙන්ද මිල ගණන් කැඳවීය. පවතින තත්වය මත භාණ්ඩ සපයාගැනීමේ අපහසුතා නිසා ප්‍රදේශයේ සේවා සපයන ආයතන මගින් ද මෙසේ මිල ගණන් කැඳවීය.

| අනු අං: | විස්තරය | සිසිර මෝටර්ස් |
|---|---|---|
| 01 | 100 Amp – 12 V Exide බැටරිය (LL 7364) | 58500.00 |

මේ සඳහා ද ආයතන තුනකින් මිල ගණන් කැඳවූ නමුත් මිල ගණන් ලැබී තිබූයේ එක් ආයතනයකින් පමණි. එක් මිල ගණනක් වුවත්, පවතින බැටරිය අක්‍රීය වී ඇති බැවින් ද, මෙය අත්‍යාවශ්‍ය වන බැවින්ද, සිසිර මෝටර්ස් ආයතනයෙන් Exide බැටරියක් රු.58500.00ට මිලදී ගැනීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය තීරණය විය.

- **තීරණ අංක 03**

සභාවට අයත් LL 7586 කැබ් රථය සඳහා අවශ්‍ය ටයර් මිලදී ගැනීමට සභාවේ ලියාපදිංචි ආයතනවලින් මිල ගණන් කැඳවන ලදි. එම මිල ගණන් පහත දැක්වේ.

| අ අං | විස්තරය | MJR පීරිස් & සන්ස් | S T C | පෙරේරා ටයර් හවුස් | ක්‍රවුන් ටයර්ස් |
|---|---|---|---|---|---|
| 01 | 650 * 16 ටයර් | (CEAT) 38802.40 | (CEAT) 42756.00 | (CEAT) 38800.00 | (CEAT) 40000.00 |

ලද මිල ගණන් අනුව, CEAT වර්ගයේ ටයර් 01ක් අවම මිල පෙරේරා ටයර් හවුස් ආයතනයේ මිලෙන් අවම වුවද, එම ආයතනය මාලබේ පිහිටා ඇත නිසා දුරසීමාව බලපාන බැවින්ද, ඉන් පසුව අවම මිල වන MJR පීරිස් & සන්ස් ආයතනයෙන් ටයර් සවි කොට සමබරතාව ද (Wheel Alignment) පරික්ෂා කර දෙන බැවින්, MJR පීරිස් ආයතනයෙන් ටයර් 01ක් රු. 38802.40 ට මිලදී ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය කරන ලදි.

- **තීරණ අංක 04**

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සිටින තෝරාගත් ගර්භනී මවුවරුන්ට පෝෂණ මල්ලක් ලබා දීමට අවශ්‍ය ද්‍රව්‍ය (වියළි ආහාර ද්‍රව්‍ය) මිලදී ගැනීම සඳහා ලියාපදිංචි සැපයුම් ආයතන නොමැති බැවින් ද, ප්‍රදේශය ආශ්‍රිත ආයතනවලින් මිලදී ගැනීම් සිදු කිරීමේදී පහසුවද හේතුවෙන් ප්‍රදේශයේ ආහාර ද්‍රව්‍ය සැපයුම් ආයතනවලින් අත් මිල ගණන් කැඳවීය. එම මිල ගණන් පහත පරිදි ය.

| අනු අං | විස්තරය | අරලිය, දැල්පිටිය | ලංකා ස්ටෝර්ස් ගම්පොල | ශ්‍රී ලංකා ස්ටෝර්ස් ගම්පොල | ධර්මසේන සහ පුත්‍රයෝ |
|---|---|---|---|---|---|
| 01 | හාල් (නාඩු) 1kg | 230.00(අරලිය) | 220.00 | 223.00 | 225.00 (නිපුන)<br>230.00 (හිරු) |
| 02 | කඩල 1kg | 690.00 | 800.00 | 775.00 | 760.00 |
| 03 | මුං ඇට 250g | 232.00 | 220.00 | 245.00 | 225.00 |
| 04 | රතු පරිප්පු 500g | 245.00 | 230.00 | 280.00 | 285.00 |
| 05 | කව්පි 250g | 188.00 | 190.00 | --- | --- |
| 06 | නූඩ්ල්ස් 400g / 500g | 230.00 (400g) | 140.00 (small) | 300.00 (500g) | 270.00 (500g) |
| 07 | හාල්මැස්සන් 250g | 487.00 | 480.00 | 550.00 | 465.00 |

ලබා ගත් අත්මිල ගණන් අනුව, **ලංකා ස්ටෝර්ස් හා ශ්‍රී ලංකා ස්ටෝර්ස්** ආයතනයෙන් ද්‍රව්‍ය මිලදී ගන්නේ නම්, අත්පිට මුදලට පමණක් මිලදී ගැනීම් කළ හැකි බවට මිල ගණන් ලබා දීමේදී දන්වා සිටියේ ය. එබැවින් හාල් වල අවම මිල රු.220.00 සහ රු.223.00 දැක්වුවත් අත්පිට මුදලින් ගෙවීමට නොහැකි බැවින් ද, එම ආයතනයන්ගෙන් එක් අයිතමයක් පමණක් මිලදී ගැනීමට නොහැකි බැවින් ද, අවම මිල ගණන් යටතේ නිපුන නාඩු සහල් 1kg රු.225.00 ට ත්, මුං ඇට 250g රු. 225.00 ටත්, නූඩ්ල්ස් (500g) රු. 270.00 ටත්, හාල්මැස්සන් 250g රු. 465.00 ට ත් ධර්මසේන සහ පුත්‍රයෝ ආයතනයෙන් මිලදී ගැනීමට සහ

අවම මිල යටතේ කඩල 1kg රු.690.00ට ත්, රතු පරිප්පු 500g රු. 245.00 ටත්, කව්පි 250g රු.188.00 ටත් අරලිය ආයතනයෙන් මිලදී ගැනීමටත් සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

- **තීරණ අංක 05**

ගබඩා ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීමට සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවන ලදි.

| අ අං | විස්තරය | දවස | පේපර්ලයින් | නිව් ජෙනරල් | මෙට්‍රොපො. | L.H.චන්ද්‍ර. | සෙන්ට්‍රල් ස්ටේෂනරි |
|---|---|---|---|---|---|---|---|
| 01 | A4 කඩදාසි | (GSM 80) 4.80 | (GSM 80) 4.93 | (GSM 75) 4.70 | (GSM 80) 6.80 | (GSM 80) 5.50 | (GSM 80) 5.00 |
| 02 | 15 * 11 (Two Ply) | 25300.00 | 30688.00 | --- | --- | --- | 28750.00 |
| 03 | මැගසින් හෝල්ඩර් 4'' | (Panther) 549.00 | (Paperline) 380.80 | (J A J) 345.00 | --- | (Panther) 556.40 | 560.00 |
| 04 | කෙම්ෆික්ස් ගම් | (250g) 260.00 | (1kg) 1993.60 | (1kg) 1980.00 | --- | 1670.00 | ( CIC - 1kg) 1390.00 |

මිල ගණන් අනුව, අවම මිල ගණන් යටතේ GSM 80 සහිත A4 කඩදාසි 01ක් රු.4.80 ට ත්, 15 * 11 (Two Ply) කඩදාසි පැකට් 01ක් රු. 25300.00 ට ත් දවස ආයතනයෙන් ද, මැගසින් හෝල්ඩර් 4'' අවම මිලට එනම් රු.380.80 ට නිව් ජෙනරල් ආයතනයෙන් ද, කෙම්ෆික්ස් ගම් 1kg රු.1390.00 ට අවම මිලට චන්ද්‍රසේකර ආයතනයෙන් ද මිලදී ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 06**

සභාවට අයත් LL-7039 ලොරි රථය සඳහා අවශ්‍ය ටෙන්ට් රෙද්දක් මිලට ගැනීමට සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් හා ප්‍රදේශයේ සැපයුම් ආයතනවලින් මිල ගණන් කැඳවීය.

| අනු අං | විස්තරය | ජයලංකා හාඩ්වෙයාර් | උපුල් හාඩ්වෙයාර් |
|---|---|---|---|
| 01 | 15 * 10 ප්‍රමාණයේ ටෙන්ට් රෙද්දක් | 2975.00 | 17500.00 (OXFORD BRAND) |

ආයතන දෙකකින් ලද මිල ගණන් අනුව අවම මිල සඳහන් ටෙන්ට් රෙද්ද තත්වයෙන් බාල වන බැවින් ද, ටෙන්ට් රෙද්දක් අවශය වන්නේ කුණු ට්‍රැක්ටරය ආවරණය කිරීමට වන බැවින් දිගු කලක් පාවිච්චි කළ හැකි එකක් විය යුතු නිසා OXFORD වර්ගයේ ටෙන්ට් රෙද්දක් උපුල් හාඩ්වෙයාර් ආයතනයෙන් රු.17500.00ට මිලදී ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය කරන ලදි.

- **තීරණ අංක 07**

පුස්තකාල තරග සඳහා ත්‍යාගයන් වෙනුවෙන් කුඩ මිලදී ගැනීමට තීරණය කොට තිබූ අතර, ඒ සඳහා පෙර 2022.06.21 දින ටෙන්ඩරයෙන් මිල කැඳවූ නමුත් මිල ගණන් ලැබී නොතිබූ බැවින් යළි මිල ගණන් කැඳවන ලදි. එම මිල ගණන් පහත දැක්වේ.

| අනු අං | විස්තරය | C I B | දවස |
|---|---|---|---|
| 01 | (දෙකට නැවිය හැකි) කාන්තා කුඩ | 1200.00 (**C I B)** | 988.00 (Rainco) |
| 02 | ළමා කුඩ | 990.00 (**C I B)** | 1102.00 (Rainco) |

ඒ සඳහා ලද මිල ගණන් අනුව දවස මධ්‍යස්ථානයෙන් සැපයිය හැකි කුඩ තත්වයෙන් හොඳ වර්ගයේ (රේන්කෝ) ඒවා වන නිසාත්, මිල ගණන් සාධාරණ වන නිසාත්, **C I B** ආයතනයේ කුඩ එම ආයතනයේම

නිෂ්පාදිත මිලද සාපේක්ෂව වැඩි නිසාත් කුඩ මිලදී ගන්නේ නම් , කාන්තා කුඩයක් රු.988.00 ට ත්, ළමා කුඩයක් රු. 1102.00 ටත් දවස ආයතනයෙන් මිලදී ගැනීම යෝග්‍ය බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 08**

සභාවේ කසළ කරත්ත සේදීමට අවශ්‍ය අධි පීඩන ජල විදුම් යන්ත්‍රයක් මිලදී ගැනීමට පෙර කිහිප අවස්ථාවන්වලදී ටෙන්ඩර් මගින් මිල කැඳවූ නමුත් එම මිලදීගැනීම් සම්බන්ධව නොයෙක් ගැටලු මතු වූ බැවින් දම්රෝ ආයතනයෙන් හෝ වෙනත් ආයතනයකින් ජල විදුම් යන්ත්‍රයක් මිලදී ගැනීම සුදුසු බවට 2022-06-21 ටෙන්ඩර් මණ්ඩලය මගින් තීරණය විය. එනමුත්, දම්රෝ ආයතනයෙන් දන්වා සිටියේ මිල ගණන්වල වෙනස්වීම් සිදුවන බැවින් ණය බිල්පත් ලෙස භාණ්ඩ නිකුත් නොකරන අතර මිල ගණනක් හෝ ලබා දීමට අකමැත්ත ප්‍රකාශ කරන ලදි. එබැවින් එක් ප්‍රාදේශීය සැපයුම්කරුවකුගෙන් අදාළ ජල විදුම් යන්ත්‍රය සම්බන්ධව මිල ගණනක් ලබාගෙන ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි. එම විස්තරය පහත පරිදි වේ.

| අනු අං | විස්තරය | Futurehomes4 (ගම්පොල) |
|---|---|---|
| 01 | හයි ප්‍රෙෂර් සේදුම් යන්ත්‍රය | 110 BAR) 26000.00<br>100 BAR) 28000.00 (General Warranty)<br>140 BAR) 37500.00 |

එම මිල ගණන පරික්ෂා කිරීමේදී කසළ කරත්ත සේදීමට එක දිගට දිනපතා මෙම යන්ත්‍රය භාවිත කළ යුතු බැවින් (බාර් ප්‍රමාණය) BAR – 140ක් වන මිල රු.37500.00ක් වන ප්‍රෙෂර් සේදුම් යන්ත්‍රය ෆියුචර් හෝම්ස්ෆෝ ආයතනයෙන් මිලදී ගැනීම යෝග්‍ය බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය කරන ලදි.

- **තීරණ අංක 09**

පුස්සැල්ලාව ආදාහනාගාරයේ සිදු කළ යුතු අත්‍යාවශ්‍ය අලුත්වැඩියා කටයුතු සිදුකිරීම සඳහා අත් මිල ගණන් කැඳවූ අතර එම මිල ගණන් පහතින් දැක්වේ.

| අනු අං | විස්තරය | බලවර්ධන | සමරසිංහ | LAL.ලියනාරච්චි |
|---|---|---|---|---|
| 01 | ප්‍රධාන පාලක පුවරුවේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සහ සේවා කිරීම | 65500.00 | 82500.00 | 70250.00 |
| 02 | උදුනේ පළුදු වී ඇති කෝණයන් අදාල සිමෙන්ති, ගඩොල් හා මැටි වර්ග යොදා අලුත්වැඩියා කිරීම. (මේ සඳහා වෙන් වූ වෙනමම සිමෙන්ති වර්ග ඇති අතර දැනට පළුදු වසා ඇත්තේ සාමාන්‍ය මැටි ගැසීමෙනි) | 62000.00 | 65000.00 | 65000.00 |
| 03 | නියමු දාහකය ( Burner ) අලුත්වැඩියා කිරීම | 48000.00 | 32500.00 | 45000.00 |
| 04 | ඉදිරිපස හා පසුපස දොරටු ප්‍රතිස්ථාපනය කිරීම | 35000.00 | 35000.00 | 35000.00 |
| 05 | ගැස් නියාමකයන් (Regulators) ප්‍රතිස්ථාපනය කිරීම | 25000.00 | 19000.00 | 23500.00 |
| 06 | දාහක පද්ධතියේ දෝෂයන් නිරාකරණය කිරීම | 63000.00 | 47500.00 | 54500.00 |
| | එකතුව - | 298,500.00 | 281,500.00 | 293,250.00 |

ඉහත මිල ගණන් පරික්ෂා කිරීමේදී අවම මිල ගණන් ලබා දී ඇති සමරසිංහ ඉලෙක්ට්‍රිකල් ආයතනයෙන් ඉහත අලුත්වැඩියාවන් රු. 281,500.00 ට සිදු කර ගැනීම සුදුසු බවත්, මැටි ගසා ඇති පෝරණුවේ කොටස් නිසා අන්තරාදායක බැවින් එයද ඉක්මනින්ම සකස් කර ගත යුතු බවත් ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 10**

කාර්යාල නිලධාරින්ට රාජකාරි කටයුතු පහසු කර ගැනීම සඳහා අවශ්‍ය වන රාජකාරි හැඳුනුම්පතක් සකස් කර ගැනීමට නැවත මිල ගණන් කැඳවන ලදි. එම මිල ගණන් පහත පරිදි වේ.

| අනු අං | විස්තරය | ටෙලිෆික්ස් | මල්ලිකා ස්ටු. | NN ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|
| 01 | රාජකාරි හැඳුනුම්පතක් සකස් කර ගැනීම | 450.00 | 490.00 | 500.00 |

ඒ සදහා ලද මිල ගණන් අනුව අවම මිල යටතේ රාජකාරි හැඳුනුම්පතක් රු.450.00 බැගින් ටෙලිෆික්ස් ආයතනයෙන් සකස් කර ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය කරන ලදි.

- **තීරණ අංක 11**

වත්තහේන ජල යෝජනා ක්‍රමයේ දෙවන අදියර ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ජල උපකරණ මිලදී ගැනීමේදී මුලින්ම චෙක්පත් ලබාදීමට සිදු වීම, අත්‍යාවශ්‍ය ජල උපාංග නොමැතිකම, ජල උපකරණවල අධික මිල වැනි නොයෙක් හේතු මත ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි හා ප්‍රදේශයේ සැපයුම් ආයතන මගින් ද මේ සඳහා මිල ගණන් කැඳවීය.

| අනු අං | විස්තරය | ජයලංකා හාඩ්වෙයාර් | ශ්‍යාමා හාඩ්වෙයාර් | මහනුවර ඒජන්සි | වෙලගෙදර ට්‍රේඩ් |
|---|---|---|---|---|---|
| 01 | ජල මීටර් | (MEN – China) 8550.00 | (MEN – 1yr warr) 8540.00 | (KENT UK) 14500.00 | 9100.00 |
| 02 | ජල මීටර් කණු | --- | --- | --- | --- |
| 03 | ඩොකබල් වැල් | --- | 3725.00 | 2750.00 | --- |
| 04 | ට්‍රිම් සීල් | --- | --- | 140.00 | --- |
| 05 | පිත්තල ජ්ලෑම් සැඩල් 90mm * ½ | --- | --- | 3045.00 (PVC) S Lon | --- |
| 06 | පිත්තල ජ්ලෑම් සැඩල් 63mm * ½ | --- | --- | 2200.00 (PVC) S Lon | --- |
| 07 | PVC ජ්ලෑම් සැඩල් 63mm * ½ | --- | 2100.00 | 2200.00 (PVC) S Lon | --- |

ඒ සදහා ලද මිල ගණන් අනුව, අවම මිල යටතේ ශ්‍යාමා හාඩ්වෙයාර් ආයතනයෙන් වසරක වගකීමක්ද සහිතව තත්වයෙන් ද උසස් වර්ගයක් (MEN) වන ජල මීටර් 01ක් රු. 8540.00 ට ත්, PVC ජ්ලෑම් සැඩල් 63mm* ½ 01ක් රු. 2100.00 ට ත් මිලදී ගැනීමටත්,

ඩොකබල් වැල් 01ක් අවම මිලට එනම්, රු.2750.00 ට ත්, ට්‍රිම් සීල් 01 ක් රු.140.00 ට ත් මහනුවර ඒජන්සි ආයතනයේ මිලදී ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය කරන ලදි. අනෙක් උපකරණ වන ජ්ලෑම් සැඩල් පිත්තල නොව PVC වර්ගය වන බැවින් එම උපකරණ නැවත මිල කැඳවීමක් සිදු කිරීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය කරන ලදි.

**<u>ටෙන්ඩර් මණ්ඩලය</u>**

01. ඩී.ජී. ගුණසේන මයා - ගරු සභාපති
02. අසේල අමරසේන මයා - ගරු උප සභාපති
03. ජයන්ත කීර්තිසිංහ මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
04. ශාන්ත නවරත්න මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
05. ඒ.එච්.ඒ.රත්නායක මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
06. හේමකුමාර නයනානන්ද මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
07. මංජුල දිසානායක මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
08. රන්ජන් රාජපක්ෂ මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
09. තංගවේලු කාමරාජන් මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
10. ඩිමෝෂි වෙලපලාගම මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි
11. කෝකිලා වරාහේන මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි

| | | |
|---|---|---|
| එස්.සුබසිංහ මිය | - | ලේකම් |
| ඩබ්.එන්.පොඩිමැණිකේ මිය | - | සංවර්ධන නිලධාරි |

සකස් කළේ: ..……………........…………

පරීක්ෂා කළේ: ………………………….....

සභාපති / ලේකම්: ……………....................….